
# අධ්‍යාපන අමාත්‍යාංශය

## පළාත්, කලාප, කොට්ඨාස හා පාසල්වල

## දත්ත නිලධාරින් සඳහා

## මාර්ගගත පුහුණු පාඨමාලාව


## පරිශීලක අත්පොත





**2025**


# පරිශීලක මාර්ගෝපදේශය


1. ඔබගේ පරිගණකය අන්තර්ජාලයට සම්බන්ධ කර Google Chrome හෝ Mozilla Firefox වෙබ් බ්‍රවුසරයක් විවෘත කරගන්න. එහි address bar හි නිවැරදිව [https://dot.moe.gov.lk/](https://dot.moe.gov.lk/) යතුරු පුවරු කරන්න.







2. ඔබ පිවිසි වෙබ් අඩවියේ "Training Modules For Data Officers at Provincial, Zonal, Divisional and School Level" යටතේ ඇති  Data Officer Trainings හි View යන්න Click කරන්න. ඉන්පසු පිවිසෙන window හි Basic Module යටතේ සඳහන් ඔබ පාඨමාලාව හදාරණ මාධ්‍ය (සිංහල හෝ දෙමළ) තෝරන්න.




3. එවිට ලැබෙන DATA OFFICERS TRAINING MODULE සඳහා පිවිසීමට ඔබ වෙත දැනටමත් ලබාදී ඇති USERNAME හා PASSWORD භාවිතාකර Data Officers Training Module වෙත පිවිසෙන්න.





ඔබගේ පරිශීලක නාමය (User Name) සහ මුරපදය (Pass word) ඇතුලත් කර Login Click කරන්න




ඔබට මේ වනවිට පරිශීලක නාමය (Username ) ලැබී නොමැතිනම් ඔබ අයත් පළාතේ පළාත් දත්ත කළමණාකරු වෙත පහත සඳහන් විද්‍යුත් ලිපිනයන් මගින් හෝ දූරකථන ඇමතුමක් ලබාදී හෝ ඔබගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය, ඔබ සේවය කරන පාසලේ නම සහ පාසල් සංගණන අංකය, පළාත, කලාපය, කොට්ඨාසය, ජංගම දූරකථන අංකය, ඔබ සම්බන්ධ කරගත හැකි පෞද්ගලික විද්‍යුත් ලිපිනය ලබාදෙන්න.

| පළාත | පළාත් දත්ත කළමණාකරුගේ නම | ඊ මේල් ලිපිනය | දුරකථන අංකය |
|---|---|---|---|
| බස්නාහිර පළාත | B.M.S.A. බස්නායක මිය | anomabasnayake@gmail.com | 0770-187 128 |
| මධ්‍යම පළාත | A.K.P.S. කොඩිතුවක්කු මිය | priyanthiekodithuwakku@gmail.com | 0777-726 113 |
| දකුණු පළාත | K.M. ප්‍රභානි මිය | kprabhani@yahoo.com | 0718-563 941 |
| වයඹ පළාත | E.M.A.S. ඒකනායක මිය | achalaekanayakekgt@gmail.com | 0712-460 507 |
| උතුරු මැද පළාත | H.M.T.S. හේරත් මිය | sithariherath@gmail.com | 0715-511 033 |
| ඌව පළාත | S.M.P. බණ්ඩාර මයා | smpbbandara@gmail.com | 0715-462 910 |
| සබරගමුව පළාත | M.T.M. අන්සෆ් මයා | ansafichem@gmail.com | 0777-038 083 |
| උතුරු පළාත | සිවඥානම් නිරූෂන් මයා | Nirushan.s19@gmail.com | 0774-442 730 |
| නැගෙනහිර පළාත | S. තුෂාන්තන් මයා | ssthushy@gmail.com | 0772-596 130 |


එවිට පහත දක්වා ඇති පිටුවට පිවිසෙයි.




මෙහි මුරපදය (Password) වෙනස් කිරීමේදී කැපිටල් අකුරක්, සිම්පල් අකුරක්, ඉලක්කමක්, විශේෂ සංකේතයක් අඩංගු අකුරු 8 ක ශක්තිමත් මුරපදයක් යෙදිය යුතුය.
උදා : D1c#5678
ඉන්පසු Save Changes බොත්තම ඔබන්න.

එම මුරපදය වෙනත් අයෙකුට ලබා නොදීමට වග බලාගන්න.


4. ඉන් අනතුරුව පහත සඳහන් තිරය වෙත ඔබ පිවිසෙනු ඇත. එහි Continue යන්න click කරන්න.





5. එවිට DATA OFFICERS TRAINING MODULE ලෙස සඳහන් පහත තිරය ඔබට ලැබේ.




ඊතලය මගින් දක්වා ඇති පුද්ගල අයිකනය මත Click කරන්න. එවිට පහත මෙනුව දිස්වේ.





එහි ඇති Profile යන්න Click කරන්න.



එවිට ලැබෙන පිටුවෙහි ඇති Edit Profile මත Click කරන්න.




මෙහිදී ඔබගේ තොරතුරු ඇතුළත් කිරීමට අවස්ථාව ලැබේ.





මෙහි General යටතේ සඳහන් First Name හි ඇති තොරතුරු වෙනස් නොකරන්න.


Surname යටතේ ඇති ඔබගේ නම ඉ - සහතික පත්‍රයෙහි සඳහන් විය යුතු ආකාරයෙන් සටහන් කරන්න.

ඊමේල් ලිපිනය සඳහන් කරන්න.

City / Town හි ඔබගේ පළාත සටහන් කරන්න.





අවසානයේ Other fields හි සටහන්ව ඇති ඔබගේ පාසලෙහි පාසල් සංගණන අංකය සහ පාසලේ නම වැරදි නම් පමණක් නැවත තෝරන්න. එසේම අනෙකුත් අධ්‍යාපන ආයතනවල (කොට්ඨාස, කලාප, පළාත්) නිලධාරින් අදාළ ආයතනයේ නම තෝරන්න.




ඉන්පසු Update profile මත Click කරන්න.


6. එවිට User Profile ලෙස පහත සඳහන් තිරය ඔබට ලැබේ.




මෙම තිරයේ වම්පස මෙනුවෙහි දක්නට ඇති Site home යන්න Click කරන්න.


එවිට ලැබෙන පිටුවෙහි ඔබගේ මාධ්‍යය සිංහල නම් Data Officers Training Modules – Sinhala යන්නට ද

දෙමළ මාධ්‍යය නම් Data Officers Training Modules -Tamil යන්නට ද අදාළ Access මත Click කරන්න.



එවිට පහත සඳහන් තිරය ලැබේ.

මෙහි දකුණු පස සඳහන් Self enrollment (student) යටතේ ඇති Enroll me යන්න Click කරන්න.




7. දැන් ඔබ මෙහි සඳහන් පාඨමාලාව ආරම්භ කිරීමට සූදානම් ය. මෙම මාර්ගගත පාඨමාලාව අවසානයේ දී ඉ - සහතික පත්‍රය උපයා ගැනීම සඳහා පහත කරුණු සම්පූර්ණ කිරීම අවශ්‍ය වේ.

   i. **1 සිට 7 දක්වා වන සියලු පුහුණු මොඩියුල ස්වයංඅධ්‍යනය කල යුතු අතර ඊට අදාළ ඇගයීම් සිදුකිරීම අනිවාර්යය වේ.**


   **ii.** **සියලු පුහුණු මොඩියුලවලට අදාල ඇගයීම් සිදු කිරීමෙන් පසු එම ඇගයීම් සඳහා 50% කට වඩා ලකුණු උපයා ගැනීම මගින් ඉ - සහතික පත්‍රය උපයා ගත හැක.**

   **iii.** **පහත පරිදි ඔබගේ සාමාර්ථය (Grade) ඉ - සහතික පත්‍රයේ සටහන් වනු ඇත.**


| සාමාර්ථය | ලකුණු පරාසය |
|---|---|
| **A** | **100% - 90%** |
| **B** | **89.99% - 80%** |
| **C** | **79.99% - 70%** |
| **D** | **69.99% - 60%** |
| **E** | **59.99% - 50%** |

8. මෙම පාඨමාලාව 1 සිට 7 දක්වා ස්වයංඅධ්‍යයන මොඩියුල 7 කින් සමන්විත වන අතර එම මොඩියුල පිළිවෙලින් අධ්‍යයනය කළ යුතුය.

පළමුවෙන් ඔබ 01. Introduction යන්න මත Click කරන්න.





එවිට පහත තිරය ඔබට ලැබේ. එහි සඳහන් කෙටි මෙනුවෙහි ඇති කතිරය මත click කරන්න.




එවිට ඔබට Data Officers Training Modules යටතේ “පරිගණක සම්බන්ධ මූලික දැනුම” වීඩියෝ මාලාව ලැබේ. එම ස්වයංඅධ්‍යයන විඩියෝව නැරඹීමෙන් අනතුරුව ඔබට පිළිවෙලින් 02 සිට 09 දක්වා ස්වයංඅධ්‍යයන වීඩියෝ නැරඹීමට අවස්ථාව ලැබේ.





එම ස්වයංඅධ්‍යයන විඩියෝ 09 ම නැරඹීමෙන් පසු ඔබට එම මොඩියුලයට අදාළ Introduction-Quiz සඳහා පිවිසීමේ අවස්ථාව ලැබේ.




එහි Introduction-Quiz යන්න Click කරන්න.
පහත තිරයේ දැක්වෙන කෙටි මෙනුවෙහි සඳහන් කතිරය Click කරන්න.





දැන් ඔබ ප්‍රශ්නාවලිය සඳහා යොමුවීමට Attempt quiz now මත Click කරන්න.




ඔබ වෙත ලැබෙන ප්‍රශ්නයට වඩාත් ගැලපෙන පිළිතුර තෝරා ඊළඟ ප්‍රශ්නය සඳහා යොමුවීමට Next page මත Click කරන්න.





ඔබට වෙනත් ප්‍රශ්න අංකයක් වෙත යොමු වීමට අවශ්‍යනම් දකුණු පස ඇති Quiz Navigation හි සඳහන් ප්‍රශ්න අංක මත Click කර ඔබට අවශ්‍ය ප්‍රශ්නය තෝරා ගත හැක.




ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයා අවසන් වූ පසු Finish Attempt මත Click කරන්න.





එවිට පහත සඳහන් තිරය මගින් ඔබ විසින් පිළිතුරු සපයා ඇති බව දර්ශනය වේ.



දැන් ඔබට යම් ප්‍රශ්නයක් සඳහා නැවත පිළිතුරු සැපයීමට අවශ්‍ය නම් Return to attempt මගින් ප්‍රශ්නයන් සඳහා යොමුවීමට හෝ පිළිතුරු සපයා අවසාන නම් Submit and all Finish මත Click කරන්න.





එවිට පහත සඳහන් තිරය මගින් නැවත ඔබගේ පිළිතුරු සපයා අවසාන ද යන වග තහවුරු කිරීමට ලැබෙන කෙටි මෙනුව මත Submit and Finish මත Click කරන්න.




ඔබ සපයා ඇති පිළිතුරු මත ඔබගේ ලකුණු ලැබෙනු ඇත. ඔබගේ ලකුණු 50% කට වඩා අඩුනම් පහත ලෙස Failed:Receive a grade ලෙස සඳහන් වී ඔබට නැවත වතාවක් එම පාඩම් මාලාවේ ප්‍රශ්නයන් සඳහා යොමු වීමේ අවස්ථාව Re-attempt quiz මගින් ලැබේ.


ඔබට මේ මොහොතේදී හෝ පසු අවස්ථාවක නැවත උත්සාහ කළ හැක.




ඔබගේ ලකුණු 50% වඩා වැඩිනම් ඔබගේ ලකුණු දර්ශනය වන පහත සඳහන් තිරය ලැබේ.




දැන් ඔබට ඊළඟ ස්වයංඅධ්‍යයන පාඩම වන වදන් සැකසුම් මෘදුකාංග සඳහා යොමු විය හැක.





9. මෙලෙස එක් එක් මොඩියුලයට අදාළ ස්වයංඅධ්‍යයන පාඩම් හා ප්‍රශ්නාවලියට පිළිතුරු සැපයීමෙන්
   2 වන මොඩියුලයේ සඳහන් Word Processing
   3 වන මොඩියුලයේ සඳහන් Spread sheet
   4 වන මොඩියුලයේ සඳහන් Presentation
   5 වන මොඩියුලයේ සඳහන් Internet & Email
   6 වන මොඩියුලයේ සඳහන් Video Conference
   7 වන මොඩියුලයේ සඳහන් Remote Access
   සම්පූර්ණ කිරීමට අවස්ථාව ලැබේ.

   මෙලෙස 1 සිට 7 දක්වා සියලු මොඩියුල සම්පූර්ණ කිරීමෙන් පසු ඔබ ඉ - සහතිකය ලැබීම සඳහා සුදුසුකම් ලබයි.

10. සියළු ස්වයංඅධ්‍යයන පාඩම් හා ප්‍රශ්නාවලි සම්පූර්ණ කිරීමෙන් පසු ඔබ ඉ - සහතිකය ලැබීම සඳහා සුදුසුකම් ලැබුවේ නම් පහත පරිදි e-certificate යන්න මත Click කරන්න.




ඉන්පසු View certificate මත Click කරන්න.



දැන් ඔබගේ E-certificate සූදානම්ය. ඔබගේ අවශ්‍යතාවය පරිදි මෙය භාගත කිරීමට (Download) හැක. ඔබට අවශ්‍ය නම් එහි මුද්‍රිත පිටපතක් ලබා ගත හැක.




**සකස් කළේ :**

දත්ත කළමනාකරණ හා තොරතුරු පද්ධති සංවර්ධන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය
පැලවත්ත
බත්තරමුල්ල.

**ඊ මේල් : dataofficermoe2@gmail.com**
**දුරකථන : 0112784837**

**සම්පත් දායකත්වය:**

D.S. කස්තුරිආරච්චි මිය (අධ්‍යාපන අධ්‍යක්ෂ - දත්ත කළමනාකරණ හා තොරතුරු පද්ධති සංවර්ධන)
H.A.S.P. සේනාරත්න මිය (නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ - දත්ත කළමනාකරණ)
K.K.S. මහේෂ් මහතා (සහකාර අධ්‍යක්ෂ - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ)
K.R. දිල්හානි මිය (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි )
N.I. රන්මණ්ඩල මයා (වෙබ් අඩවි සංවර්ධන)
K.H.S.A. සිරිමාන්න මයා (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර)